ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

## පුවත්පත් නිවේදනය

## ඉන්දීය රජයේ මානුෂීය ආධාර වැඩසටහන්

සංවර්ධන සහයෝගීතාවය හරහා ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක ජනතා කේන්ද්‍රීය ඉන්දියානු ව්‍යාපෘතීන් තවත් අර්ථවත් කරමින් ඉන්දියාව ශ්‍රී ලංකාවේ අවශ්‍යතා සහිත ජනතාව වෙත සෘජුවම ළඟා වෙමින් විවිධ මානුෂීය ආධාර වැඩසටහන් යටතේ ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීමට ප්‍රයත්න දරයි.

2. දෙවන ලේකම් අශෝක් කුමාර් මහතා විසින් 2022 අප්‍රේල් 27 වන දින අම්පාර දිස්ත්‍රික්කයේ කල්මුනේ ප්‍රදේශයේ වැන්දඹුවන් සහ අවශ්‍යතා සහිත පවුල් සඳහා වියළි ආහාර බෙදා දෙන ලදී. තරුණ කාන්තා මුස්ලිම් සංගමය හා එක්ව සංවිධානය කර තිබූ මෙම විශේෂ වැඩසටහනෙහි අරමුණ වූයේ ළඟ එන රාමසාන් උත්සවය වෙනුවෙන් ප්‍රතිලාභීන්ට අවශ්‍ය ද්‍රව්‍ය ලබා දීමයි.

3. ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ආචාර්ය රේවන්ත් වික්‍රම් සිං මහතා විසින් 2022 අප්‍රේල් 17 වන දිනට යෙදුණු පාස්කු දින වැලිගම්පිටිය, ශාන්ත අන්තෝනි දේවස්ථානයේ බැතිමතුන්ගේ පවුල් සඳහා වියළි ආහාර ද්‍රව්‍ය බෙදා දෙන ලදී. එසේම සිංහල සහ දමිළ අලුත් අවුරුද්දට පෙර කුරුණෑගල දිස්ත්‍රික්කයේ බිංගිරිය ප්‍රදේශයේ ගම්මාන හයක සහ අනුරාධපුර දිස්ත්‍රික්කයේ මැදවැව සහ කිරිමැටියාව

යන ගම්මානවල අවශ්‍යතා සහිත ජනතාවට ද වියළි ආහාර බෙදා දෙන ලදී.

4. විශේෂ මානුෂීය ආධාර වැඩසටහන් මාලාව මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මහතා විසින් 2022 මාර්තු 13 වන දින යාපනයේදී ආරම්භ කරන ලද අතර එහිදී මහ කොමසාරිස්තුමා සහ ධීවර අමාත්‍ය ඩග්ලස් දේවානන්ද මහතා විසින් ධීවර පවුල් 600ක් සඳහා අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය ලබා දෙන ලදී. ඉන් අනතුරුව මුලතිව්, කිලිනොච්චි සහ මන්නාරම යන දිස්ත්‍රික්කවල ධීවර පවුල් සඳහා ද අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය බෙදා දෙන ලදී.

5. මහනුවර සහකාර ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය සහ යාපනය සහ හම්බන්තොට ඉන්දීය කොන්සියුලර් ජෙනරාල් කාර්යාල ද ශ්‍රී ලංකාවේ අවශ්‍යතා සහිත ජනතාවගේ එදිනෙදා ජීවිතයට ශක්තියක් වෙමින් ආහාර සහ වෙනත් අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය ලබා දෙන මෙවැනි වැඩසටහන් ක්‍රියාත්මක කරයි.

***

කොළඹ
2022 අප්‍රේල් 29